# ගුණදාස අමරසේකරගේ බෞද්ධ තේමාත්මක ආඛ්‍යාන කාව්‍ය ආශ්‍රිත විමර්ශනයක්

කල්ප එරන්ද[1]

## හැඳින්වීම

ආඛ්‍යානය යන්නෙහි මතුපිට අර්ථය කීම වේ. එහෙත් ව්‍යවහාරයේ දී විවිධ අර්ථවල යෙදෙයි. සිද්ධි සමූහයක් අර්ථයක් ඇති වන සේ එකිනෙක ගළපා විස්තර කිරීමෙන් ලැබෙන ප්‍රවෘත්තිය ආඛ්‍යානය නමින් හැඳින්විය හැකි ය. ඒ අනුව ආඛ්‍යානය යන්න කතාව, කථා ප්‍රවෘත්තිය යන අර්ථ ගනී. අද්‍යතන සාහිත්‍ය ක්ෂේත්‍රයෙහි කථාවක් ඉදිරිපත් කිරීමේ මාර්ග අතුරෙන් එකක් ලෙස ආඛ්‍යානය සැලකේ. ආඛ්‍යානය (Narrative), සංවාද (Dialogue), වර්ණනා (Description), විවරණ (Cooentary) යන සතරේ සංයෝගයෙන් කථාවක් සම්පූර්ණ වේ. එසේ ගත් කල්හි වර්ණනා, විවරණ යන කොටස් දෙක ද ආඛ්‍යාන ගණයට ම අයත් කෙරෙන බව පෙනේ. මේ විග්‍රහය වඩාත් අදාළ වන්නේ නවකතා කෙටිකතා ආදි නිර්මාණවල ආඛ්‍යාන විධි (Narrative forms) ගැන සලකා බැලීමේ දී ය. මේ අනුව කතාවක් ඉදිරිපත් කිරීමේ දී කතුවරයා විසින් ඉදිරිපත් කරනු ලබන සියලු භාෂාමය උපක්‍රම ආඛ්‍යාන විධි වශයෙන් පුළුල් ලෙස සැලකිය හැකි ය (සුරවීර, 1984:18,19).

'ආඛ්‍යානය' (Narrative) සේ ම 'ආඛ්‍යානවේදය' (Narratology) මේ වන විට බටහිර සාකච්ඡා, සංවාද ආදියට භාජනය වී ඇති විෂයයකි. ආඛ්‍යානවේදය සිද්ධාන්ත ආඛ්‍යාන හා ආඛ්‍යාන ආකෘතිය පිළිබඳ ඉගෙනීම සඳහා යොමු කෙරෙයි. මූලධර්මවලට අනුකූල ව මේ වචනය භාවිත වනුයේ ආඛ්‍යානය පිළිබඳ ක්‍රමවත් අධ්‍යයනයකට වුව ද, පරිශීලනයේ දී එහි ව්‍යවහාරය තරමක් සීමා වී ඇත. එහි මූලධර්ම පිළිබඳ ඉතිහාසය ඇරිස්ටෝටල් යුගය දක්වා දිවගිය ද, නූතන ආඛ්‍යානවේදය පිළිගන්නා පරිදි මෙය ආරම්භ වී ඇත්තේ රුසියානු ආකෘතිවාදය සමගිනි (Prince, 1994: 524).

'ආඛ්‍යානය' (Narrative) යනු කතා ප්‍රවෘත්තිය යි. කතාවක් ඉදිරිපත් කිරීමේ දී කතුවරයා යොදා ගන්නා භාෂාමය උපක්‍රම ආධ්‍යාන විධි (Narrative Forms) ලෙස හැඳින්විය හැකි ය. මේ සඳහා උපයුක්ත පර්යේෂණ ක්‍රමවේදය වන්නේ අඛ්‍යානවේදය යි (Narratology). ආඛ්‍යානය පිළිබඳ ක්‍රමවත් අධ්‍යයනයක් සඳහා මෙය ඉවහල් වෙයි. එනම්, කතා කලාව පිළිබඳ අධ්‍යයනය ආඛ්‍යානවේදය ලෙස නම් කළ හැකි ය. ආඛ්‍යාන කාව්‍ය (Narrative Poetry) යනු කාව්‍ය ප්‍රභේදයකි.

විග්‍රහයෙහි පහසුව සඳහා නූතන ආඛ්‍යාන කාව්‍ය වර්ග සතරකට බෙදා දැක්විය හැකි ය.

1 සිංහල අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, හෝමාගම, ශ්‍රී ලංකාව.
eranda@bpu.ac.lk

1. යථාර්ථවාදී ආඛ්‍යාන කාව්‍යය

2. පූර්ණ සංකේතාත්මක ආඛ්‍යාන කාව්‍යය

3. සංකල්පරූපාත්මක ආඛ්‍යාන කාව්‍යය

4. සංකේතාත්මක ආඛ්‍යාන කාව්‍යය (අමරසේකර, 2014: 69)

මෙහි පූර්ණ සංකේතාත්මක ආඛ්‍යාන කාව්‍යවල විශේෂ ලක්ෂණය වන්නේ සංකේත සමුදායක් මගින් මානව අත්දැකීම් නිරූපණය යි. මෙහි දී යථාර්ථයට වඩා වැදගත් වන්නේ සංකේත සමූහය කෙරෙහි ය. ගුණදාස අමරසේකරගේ අමල් බිසෝ, ගුරුළු වත සහ අසක් දා කව නිදසුන් ලෙස දැක්විය හැකි ය (අමරසේකර, 2014:70).

**අරමුණ**

මේ පර්යේෂණයේ අරමුණ වන්නේ ගුණදාස අමරසේකරගේ බෞද්ධ තේමාත්මක ආඛ්‍යාන කාව්‍යවල ස්වරූපය ආඛ්‍යානවේදී ව අධ්‍යයනය කිරීම යි.

**පර්යේෂණ ක්‍රමවේදය**

මේ පර්යේෂණය සිදු කිරීමේ දී අප විසින් තෝරා ගනු ලැබුවේ ගුණාත්මක පර්යේෂණ ක්‍රමය යි. මෙහි දී භාවිත කළ මූලික න්‍යාය වන්නේ ආඛ්‍යානවේදය යි. ගුණදාස අමරසේකරගේ බෞද්ධ තේමාත්මක ආඛ්‍යාන කාව්‍යවලින් සංකේත අරුත් ප්‍රතිපාදනය වන්නේ කෙසේ දැ යි සොයා බැලීම මෙහි දී සිදු කෙරෙයි.

**සාකච්ඡාව**

ගුණදාස අමරසේකරගේ බෞද්ධ තේමාත්මක ආඛ්‍යාන කාව්‍ය විමර්ශනය කිරීමේ දී යම් සංකේතී අරුත් ප්‍රතිපාදනය කරයි. ඒ නිසා තත් කාව්‍ය ආධ්‍යාහාර්ය ආඛ්‍යාන කාව්‍යය ලෙස හැඳින්විය හැකි ය. (Elliptical Narrative Poetry) එසේ ම ඔහුගේ ආඛ්‍යාන කාව්‍යවලින් චිරන්තන ආඛ්‍යාන සේ පිරිපුන් ආඛ්‍යාන විද්‍යමාන වෙයි. අමරසේකරගේ අමල් බිසෝ, ගුරුළුවත සහ අසක් දා කව යන අඛ්‍යාන කාව්‍යත්‍රය මෙහි ලා නිදර්ශන වේ. අමල් බිසෝ නමැති ආඛ්‍යාන කාව්‍යය ලිංගිකත්වය පිළිබඳ නව ආකල්ප ප්‍රකට කරන කාව්‍යයකි. ස්ත්‍රියකගේ පතිවත බිඳීම සාම්ප්‍රදායික දැක්මෙන් වරදක් වුව ද ඒ දෘෂ්ටිය පොදු මිනිස් දුර්වලතාවක් ලෙස කවියා හඟියි. මෙහෙයින් මෙකී කාව්‍යය ස්ත්‍රිය අරබයා ප්‍රගතිශීලී දෘෂ්ටියක් හෙළි කාව්‍යයක් ලෙස දැක්විය හැකි ය. විමලා නම් වූ කාන්තාවක අරබයා අමල් බිසෝ නම් තරුණිය සංකේත අරුත් ප්‍රතිපාදනය වන සේ කවියා යොදාගෙන ඇත.

'විමලා අඬා නො වැලපෙන්න. ඔබ අතින් සිදුවූයේ මිනිසත් බවට හිමි වරදක් බව මම දනිමි. මම එය ලොවට ඇසෙන සේ කියන්නම්' (අමරසේකර, 1961:35).

කාව්‍යයට පූර්විකාවක් වන උක්ත සටහන කාව්‍යයෙහි ධ්වනි පූර්ණ ලෙස කවියා යොදා ගනියි. ස්ත්‍රී දූෂකයන් සමාජය නමැති විලෙහි රකුසන් ලෙස මෙහි සංකේතිත ය.

එකමත් එක විලක් ඈ තී
එවිල රකුසු අරක් ග තී
වදුරු සෙ ගිනි විහිදුව තී
දුටුව සතෙක් කා දම තී (අමරසේකර, 1961:36)

රන් විමනෙක රුවන් දොරක් සාදා රැකවල් ලා ඇතිදැඩි වුව ද අමල් බිසෝට ද සෙසු මිනිසුන්ට සේ ම හැඟීම් දැනීම් පොදු වූවකි. මෙලෙස පමණ ඉක්මවා කරන සීමා බන්ධන පශ්චාත්කාලීන ව එය යමහලක් විදාරණය වන්නා සේ පුපුරා යාමෙන් සිදුවන අනර්ථය ප්‍රබල ය. මෙය ජාතක පොතෙහි වූ නලිනී ජාතකය සේ රාගය වුව ද අනවශ්‍ය පරිදි ඔබා තබා ගැනීමේ අනිටු විපාක ප්‍රකර කරන කතාවකි. එය සාමාන්‍ය පරිදි ක්‍රියාත්මක වීමට ඉඩ හළේ නම් මෙවැනි අනර්ථයක් සිදු නො වන බව කවියා ඉඟි කරයි. එමගින් ජාතක කතාවල බෞද්ධ ඡායානුවාද අමල් බිසෝ කාව්‍යයෙහි පතිත වී ඇත. අමල් බිසෝ ද රකුසන්ගේ ග්‍රහණයට නතු වීමෙන් දූෂණය වූ ආකාරය කවියා මෙසේ පවසයි.

පිට පිට හෙණ හඬ විහිදි ණ
මිහිකත සත් යළක් සැලි ණ
සිරුර බිඳී ලේ වැගිරි ණ
එගිනි මැදෙහි ඈ බිලිවි ණ (අමරසේකර, 1961:55)

අමල් බිසෝ නම් ආධ්‍යාහාර්ය ආඛ්‍යාන කාව්‍යයේ කවියාගේ අධ්‍යාශය වී ඇත්තේ මෙවන් ඉරණමකට පත් ගැහැනියක සිය පතිවත බිඳ ගැන්ම සාම්ප්‍රදායික දැක්මෙන් බැලිය නො යුතු බව ය. මෙහෙයින් මෙකී කාව්‍යය ද නව දෘෂ්ටියක් පාඨකයා වෙත ප්‍රදානය කරයි.

ගුණදාස අමරසේකරගේ ගුරුළු වත නම් ආධ්‍යාහාර්ය ආඛ්‍යාන කාව්‍යයට විෂය වී ඇත්තේ දුර සිට පෙම් කිරීමට රුචි වූ පුද්ගලයකුගේ මනෝභාවයකි. ස්ත්‍රී පුරුෂ උභය පාර්ශ්වයෙහි පවත්නා ප්‍රේමය සම්බන්ධ අපූර්ව අනුභූතියක් මෙහි ලා වස්තු වෙයි. රනඹරෙහි දිවි ගෙවන ගුරුළු රාජයා බොල් පොළොවේ කතකට දුර සිට පෙම් බඳියි. ඔවුනොවුන් කායික ලෙස එක් වීම ඔහු පිළිකෙව් කරයි. එසේ වුව ද කාන්තාවක් පතන්නී දරු මුනුපුරන් සහිත ව එක් කුටුම්බයක දිවි ගෙවීමට ය. මේ පරස්පර විරෝධී චිත්ත තත්ත්වය මනුෂ්‍ය ජීවිතයේ සංකේත අරුත් ප්‍රතිපාදනය වන පරිදි කවියා ආඛ්‍යානය විකාශනය කරයි. කාව්‍යාවසානයෙහි ගුරුළා ජීවිතයෙන් පලා යාමට යත්න දරයි.

ප්‍රශ්නවලට මුහුණ නො දෙනු වස් දිවි නසා ගන්නා ගුරුළා කෙරෙහි සහෘදයාගේ විවේචනාක්ෂිය යොමු වන පරිදි කවියා එකී චරිතය හසුරුවා ඇත. වරෙක බියමුසු කෙනෙකු මෙන් ක්‍රියා කරන ගුරුළා තවත් විටෙක ක්‍රියා කරනුයේ ජීවිතය පිළිබඳ කිසිදු අවබෝධයක් නොමැත්තකු සේ ය. ඔහු ස්ථිර ලෙස යම් අදහසක පිහිටීමට අසමත් ය. කෝපයෙන් ස්ත්‍රිය හැර දමා යන ගුරුළා වියෝගය දරනු නුහුණු ව යළිදු ඈ වෙත පැමිණෙනුයේ වරද තමන්ගේ යැයි පිළිගනිමිනි. පූර්වයෙහි ස්ත්‍රී පුරුෂ කායික සංසර්ගය දැඩි පිළිකුලින් හෙළා දක්නා හේ ස්ත්‍රියගේ පෙලඹීම මත එයට යොමු වූ පසු නො බිඳිය

හැකි අයුරින් දැඩි ලෙස එහි ම බැඳෙයි. ගුරුළාගේ චරිතයෙන් ප්‍රකට වනුයේ මිනිසාගේ ආශා ය. එම ආශාවලට සාමාන්‍ය පරිදි ක්‍රියාත්මක වීමට ඉඩ හළේ නැතිනම් සිදුවන අනර්ථය බෞද්ධ තේමාත්මක පසුබිම කියාපායි. කාව්‍යාවසානයෙහි ගුරුළා ද ආත්ම විවේචනයක යෙදෙයි.

ඔබ අතින් එ දෙවෙනි උපත මම
ලැබගතිමි නිබොරු ය වදන ඔබ
දුටු නමුත් එ මගින් නියම මග
ඒ මගෙහි පිවිසෙනු හැකි ද මට (අමරසේකර, 1963:53,54)

කවියා ගුරුළාගේ ආශා හා අවශ්‍යතා ගැඹුරින් ග්‍රහණය කර නො ගැනීම නිසා එහැම ගුරුළාට ම විශේෂ වූ විකාරරූපී දැ ලෙස තැකීමට පෙලඹුණු සේ ය. කවියා ගුරුළා කෙරෙහි සානුකම්පික දෘෂ්ටියක් හෙළයි. එනමුදු කවියෙන් ධ්වනිත කෙරෙනුයේ යථාර්ථයට අනුගත වීමට නො සමත් හෙයින් ගුරුළා විනාශයට බඳුන් වූ බැව් ය. එයට තුඩු දෙනුයේ කවියාගේ ම දෘෂ්ටියෙහි පවත්නා සීමාවන් සේ ය. ස්ත්‍රිය ගුරුළාට පවසන්නී බෙන්දකි.

දිනා එසැල ලොව අප හද පෙමින් දළ
තනා සොඳුරු රන් විමනක් පොළෝ තල
ලබා දූ පුතුන් ආසිරි දිගා බල
ලබා ගනුව දැන් අපි එහි යමු සමිඳ (අමරසේකර, 1963:52)

ඇගේ වදන්වලින් ප්‍රකට වනුයේ මධ්‍යම පාන්තික දිවි පෙවෙතක ආශා හා අපේක්ෂා ය. ගුරුළා එවන් ආශා හා අපේක්ෂා සහිත දිවි පෙවෙතක් නුරුස්සයි. ඔහු දිවි නසා ගැන්මට යත්න දරනුයේ එහෙයිනි. ඔහු එසේ කරනුයේ යථාර්ථයට මුහුණ දීමට නො සමත් නිසා මතු නො ව, මිනිසුන් ගත කරන්නා වූ දිවි පෙවෙත නුරුස්නා හෙයිනි. කවියා ගුරුළා අභිමුව වූ ප්‍රශ්නවල හරයට ළං වනු වස් අසමත් වූ හෙයින් කාව්‍යය අවසාන කෙරෙනුයේ යථාර්ථයට අනුගත ව දිවි ගෙවීමෙහි අවශ්‍යතාව අවධාරණය කරමිනි. මිනිසුන් සතු ව පවත්නා ගූඪ චෛතසික ස්වභාවය ගුරුළුවත කාව්‍යයෙන් කියා පායි.

මෙවන් වූ මනෝභාව ප්‍රස්තුත කොටගත් තව ද බෞද්ධ තේමාත්මක අධ්‍යාහාර්ය ආඛ්‍යාන කාව්‍යයක් ලෙස ගුණදාස අමරසේකරගේ අසක් දා කව දැක්විය හැකි ය. ආසංඛවතී ජාතකය වහල් කොටගෙන රචිත ජාතක කථා කාව්‍යයක් ලෙස මෙකී අඛ්‍යානය විකාශනය කෙරෙයි. අසක් දා කවෙහි තේමාව නවීන සමාජයෙහි ශීඝ්‍රයෙන් වියැකෙන ආධ්‍යාත්මික සාරධර්මවල වැදගත් බව ප්‍රකට කරන්නකි. බඹදත් රජු, කුමරිය හා තවුසා අතර පවත්නා මානව සබඳතාව ඇසුරෙන් ආශාව හා නිරාශාව අතර ගැටුමක් මෙයින් නිරූපණය කෙරෙයි. ආසංඛවතී ජාතකයෙහි ඉඟි කරන චින්තනය අමරසේකර කාව්‍යාවසානයෙහි මෙසේ කුළුගන්වයි.

විසුව යමෙකු අල පත වැකි දිය ලෙසි ත
ලබති හදක් නො ඇලී නො ගැලී විඳි ත
නොමැති ඉඩක් තුන් ඉඳුරනට බිලි ව ත
විඳිනු සමත් වෙති දුක සැප සම සිති ත (අමරසේකර, 2003:33)

අසක් දා කව සඳහා විෂය වන රජු, හිමාල වනය හා තවුසා පිළිබඳ පුවත සංකේතමය අගයක් ගනියි. කවියා කතා පුවතෙහි වූ චරිතයන්ට සංකේතාර්ථ ආරෝපණය කරයි. රජු තෘෂ්ණාව නොහොත් අත්පත්කර ගැන්මේ සංකේතයකි. කුමරිය රත් පියුමකින් උපත ලද හෙයින් ඈ උත්තර මානුෂිකත්වයේ සංකේතමය ලොවට පිවිසෙයි. කවියා මෙයින් රූපණය කරනුයේ ද පුද්ගල මනෝභාව සතු සංකීර්ණ ස්වභාවය යි.

කුමරිය අත්පත් කර ගැන්මේ චේතනාවෙන් සිටි රජුට ඇය ලබා ගත නුහුණු වේ. ඔහු දහසක් නම් පටබැඳ පැවසුව ද කිසිවකින් පලක් නො වේ. ඔහුට ඇය ලබා ගත හැක්කේ අත්පත් කර ගැන්මෙහි දැඩි ආශාව අත් හළ විට පමණි. එවිට ම ඔහුගේ මුවින් ඇගේ නම ක්ෂණයෙන් පිට වෙයි.

නැත හද තවත් ආසා ගත සිත මඩි ත
නැසුවෙමි සියලු ආසා හද පොලඹව ත
විඳිනෙමි සුවය ආසා හළ සිත ගෙනෙ ත
විඳිනුව එ සුව හැර ආසා නම් ඉති ත (අමරසේකර, 2003:31)

තවුසාගේ මනසත් හදවතත් අතර හටගන්නා වූ අරගලය එහි දකින්නේ ඔහු ද රජු ද අතර ජනිත වන්නා වූ අරගලයක් ලෙසිනි. කුමරියගේ නම නිවැරදි ව කිවහොත් ඈ ඔහුට සරණපාවා දෙන බැව් තවුසා කියයි. තවුසාගේ ඒ අභියෝගය කුමරියගේ නම හෙළි කිරීමට වඩා තම හදෙහි ඇත්තේ කුමක් දැ යි නිරාවරණය කරන ලෙස කරන අභියෝගයකි. අවසානයේ රජු කුමරියගේ නම ආශා යනුවෙන් හෙළි කිරීම තවුසාගේ හදවත වෙළා සිටින ආශාව හෙළි කිරීමක් බැව් දිස් වේ. මේ හෙළි කිරීමත් සමඟ තම හදවත වෙළා සිටි කෙලෙස් සිත පිළිබඳ සවිඤ්ඤාණකත්වය ලබන තවුසා කුමරිය රජුට සරණපාවා දෙයි.

**නිගමනය**

ගුණදාස අමරසේකරගේ බෞද්ධ තේමාත්මක ආඛ්‍යාන කාව්‍යත්‍රය නූතන සිංහල ආඛ්‍යාන කාව්‍යවල සංකේතී අරුත් ප්‍රකට කරන ආධ්‍යාහාර්ය ආඛ්‍යාන කවීන්ගේ (Elliptical Narrative Poetry) ලක්ෂණ ප්‍රකට කරයි. එය ආශාව සහ නිරාශාව අතර සංකේතී අර්ථ ප්‍රතිපාදනය කරයි. එම ආඛ්‍යාන කාව්‍යත්‍රය සිංහල චිරන්තන ආඛ්‍යාන අනුදත් මගෙහි ම රචනයෙහි යෙදුණු අතර එයින් ද පූර්ණ ආඛ්‍යාන විද්‍යමාන වෙයි.

**ප්‍රමුඛ පද** - ගුණදාස අමරසේකර, ආඛ්‍යාන කාව්‍යය, බෞද්ධ තේමාත්මක, ආධ්‍යාහාර්ය ආඛ්‍යාන කාව්‍යය

## ආශ්‍රිත ග්‍රන්ථ


අමරසේකර, ජී. (1961). *අමල් බිසෝ*. ගම්පහ: සරසවි මුද්‍රණාලය.

අමරසේකර, ජී. (1963). *ගුරුළු වත*. ගම්පහ: සරසවි මුද්‍රණාලය.

අමරසේකර, ජී. (2002). *අසක් දා කව*. බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශන.

අමරසේකර, ජී. (2014). *මතක වත*. බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශන.

සුරවීර, ඒ. වී. (1984). *ඇරිස්ටෝටල් කාව්‍ය ශාස්ත්‍රය*. කොළඹ: සීමා සහිත ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට් සමාගම.

Prince, G. (1994). *Narratology: Johns Hopkins Guid to Literart Theory and Criticism*. UP.Bolt-imore: Johns Hopkins.